# කුට්ටම් පොකුණ



ලක්ෂ්මන් කොඩිතුවක්කු




අද දවසේ අප රටේ දේශපාලන ලෝකයේ ප්‍රධාන මාතෘකාවක් බවට පත්ව ඇත්තේ සරත් ෆොන්සේකා මහතාගේ දේශපාලන ප්‍රවිශ්ඨයයි. එය විශේෂිතම වන්නේ මීට පෙර ඔහු කිසිම දිනෙක අප රටේ දේශපාලනය පිළිබඳව කථා නොකළ නිසාය. දේශපාලනය ගැන කථා කලත් ඔහු කීවේ තමාගේ අප්‍රියම වචනය දේශපාලනය බවයි. එහෙත් අතීතයේ කළ කී දෑ අමතකව ගොස් ඇති සරත් නමැති මහත්මා යුධ නිලධාරියා අද දේශපාලනය වැළඳගෙන ඇත. ඒ නිසා සරත්ගේ හමුදා ලෝකය තුළ ඔහුට පසමිතුරෙකු වී ඔහු-ගේම අණසක යටතේ මැරුම් කෑ ප්‍රභාකරන් අතීතයේ කළ ප්‍රකාශය නැවත මෙනෙහි කිරීමට අපට සිදුවේ. "සිංහලයා අතීතය ඉක්මනට අමතක කරනවා" යන කියමනයි.

සරත් පමණක් නොව අප රටේ දේශපාලකතුමන්ලාගේ සිට සාමාන්‍ය දුගී ජනතාවටද අතීතය අමතක වන්නේ නැගී එන ප්‍රශ්න කන්දරාවට සමගාමීවය. දේශපාලඥයෝ ජනතාවගේ ආර්ථික ප්‍රශ්න රැකියා ප්‍රශ්න අමතක කරමින් යුධ ජයග්‍රහණය පමණක්ම කථා කිරීමත් සාමාන්‍ය මිනිසුන්ට දැන් "රටට" වඩා "බඩට" දැනෙන කුසගින්න වැඩිවීමත් මෙයට හොඳම උදාහරණයන්ය.

සරත් ෆොන්සේකාට දේශපාලනය කිරීමට ඇති අයිතියට අපි ගරු කරමු. එසේම ඔහු එයට ප්‍රවිශ්ඨ වන්නේ හමුදා නිලධාරියෙකු වශයෙන් නොවේ. සාමාන්‍ය මිනිසෙකු වශයෙනි. එනිසා හමුදා ලොක්කෙකු දේශපාලනයට ඇවිත් රටේ නායකයෙකු වුවහොත් ඔහු ඉසි අමීන්ට හෝ බුරුමයේ වත්මන් හමුදා පාලකයාට සමාන කළ නොහැක්කේ එහෙයිනි. එහෙත් සරත් ෆොන්සේකා දේශපාලනයට ප්‍රවිශ්ඨ වන්නේ ඇයි! ඒ ගැන රටේ ජනතාව දෙවරක් සිතා බැලිය යුතුය.

මීට පෙර අපේ රටේ පාලකයන්ට මෙන්ම ජනතාව අතර වීරයෙක්ව සිටි කොබ්බෑකඩුව මහතාද රට ජාතියට ආදරය කළ උදාර හමුදා නිලධාරියෙකි. එහෙත් ජේ. ආර්. ජයවර්ධනගෙන් පසු බලයට පැමිණි ප්‍රේමදාස මහතාටද කොබ්බෑකඩුව පෙනුනේ අනාගතයේදී තමාගේ බලය උදුරා ගන්නට එන භයානක සෙවනැල්ලක් ලෙසිනි. හමුදා නායකයෙකු ජනතාවට ලංලංවන්නට රටේ දේශපාලන නායකයාට හිතේ පැල්පදියම් වන කුකුස හා වෛරය සදාතනික බව මේ දේශපාලන ලෝකය තුලින්ම බොහෝ උදාහරණ අපිට සොයාගත හැකිය.

චන්ද්‍රිකා සමයේ කුණුගොඩකට ඇද දමා හමුදා ලෝකය තුළ නන්නත්තාර වී සිටි සරත් අළු ගසා දමා පැමිණියේ මහින්දාගමනය තුළිනි. මහින්ද බලයට නොඑන්නට අද සරත් නමැති චරිතය මතුවන්නේ නැත. එසේම රනිල්, එස්.බී. මංගල නමැති ත්‍රිත්වය තුළින් දැඩි ලෙස විවේචනයට පාත්‍ර වූ සරත්ව ආරක්ෂා කර ගත්තේ මහින්දය. ජානක පෙරේරා නැමැති හිටපු විශිෂ්ඨ හමුදා නිලධාරියාව දේශපාලනයට කැන්දා ගෙන විනාශ කර දැමූ රනිල් මෙන් මහින්ද සරත්ව විනාශ කර දැමුවේ නැත. ඔහුට යුද්ධය සාර්ථකව කරගෙන යෑමට ආම්පන්න සැපයුවේය. සෑම වචනයකින්ම ඔහු තමාගේ හමුදා නායකයාව ආරක්ෂා කර ගත්තේය. සරත් නැමැති චරිතය ජනප්‍රිය වන්නේ මහින්ද නමැති අධ්‍යක්ෂකවරයා යටතේ හා ගෝඨාභය නමැති තිර රචකයා හමුවේය. ඒ සරත්ම පොදු අපේක්ෂකයෙකු වශයෙන් ජනාධිපතිවරණයට ඉදිරිපත් වන්නට යන්නේ රටේ පොදු යහපතටත් වඩා යුද්ධයෙන් පසු තමාට ඇති වූ සිත් අමනාපකම් නිසාය. යුධ ජයග්‍රහණයෙන් පසු තමා ලබාගත් අභිමානය හෑල්ලුවට ලක් වූ නිසාය. එසේනම් සරත් යුද්ධ කර ඇත්තේ අභිමානය වඩවා ජයග්‍රහණයෙන් උදම් අනන්නටය. කිසිම දෙයක් නොලබා, නොපතා රට වෙනුවෙන්ම ජීවිතය දන්දුන් දහස් ගණනක තරුණ ජීවිත පොළවේ පස් මත සැතපෙද්දී රටේ නායකයා සමඟ උකටලී වූ සරත් දේශපාලනයට පැමිණියේ රට ගැන සිතාද?

වත්මනේ මේ රට පාලනය කළ සෑම නායකයෙක් යටතේම දූෂණය භීෂණය තිබුණේය. දරිද්‍රතාවය තිබුණේය. මේ ධනවාදී ගෝලීයකරණය තුළ අවංකවම සරත්ට දූෂණය භීෂණය නැති කළ නොහැක. නායකයා ඔහු වුවත් වටේ සිටින කාක්කන්ගෙන් ඔහුට බේරී දූෂණය නැති කළ නොහැක. එහෙයින් මහින්ද සේම සරත්ගෙන් වුවත් දූෂණය, භීෂණය නැති කර ගත හැකිය කියා අපිට විශ්වාස තබාගත නොහැක. එසේම පොදු අපේක්ෂක ජයග්‍රහණය තුළින් ඊට පසු ඔහු වටා කේන්ද්‍රිය වන්නේ කවුරුන්ද? ඒ දූෂණය භීෂණය රජ කළ පිරිස්මය. එසේනම් ඔවුන් තුරන් කිරීමට සරත්ට නැවතත් හමුදා ආණ්ඩුවක් පිහිටුවීමට සිදුවේ. තරුපටි පැළඳ ගැනීමට සිදුවේ. එසේනම් මියගිය ගාමිණි ෆොන්සේකා මහතා කිව්ලෙස අපේ රටේ බිහිවෙන හමුදා ආණ්ඩුව බිහිවන්නේ සරත් ෆොන්සේකා අතින්ද? එසේනම් ඒ ඒකාධිපති බලතල සහිත හමුදා නායකයා හැසිරෙන්නේ කෙලෙසද? ඒ නිසා සරත්ට ඡන්දය පාවිච්චි කිරීමට පෙර ජනතාව දෙවරක් සිතා බැලිය යුත්තේ එහෙයිනි.

අපරටේ ජනාධිපතිවරු දෙදෙනෙක්ම පත් කර ගැනීමට පෙරහැරේ ගිය ජනතා විමුක්ති පෙරමුණ මෙවර සැරසෙන්නේ දූෂණය නැති පිරිසිදු පොදු අපේක්ෂකයෙකු ඉදිරිපත් කර එම ජයග්‍රහණය තුළින් ජනාධිපති බලතල ඉවත් කර රටේ නායකයා පාර්ලිමේන්තුවට උත්තර බඳින අගමැතිවරයෙකු කර සර්ව සාධාරණ ප්‍රජාතන්ත්‍රවාදී පිරිසිදු පාලන ක්‍රමයක් ඇති කර ගැනීමටය. එහෙත් "බලය" නැමැති සාධකය හමුවේ මේ "සර්ව සාධාරණ" යන වචනය නිෂ්ක්‍රීය වන බව සුළු බහුතර බලයක් ඇති ජනතා විමුක්ති පෙරමුණ තවමත් හඳුනාගෙන නැත්තේය.

මැකියාවෙලී දර්ශනය අනුව රාජ්‍යයක ප්‍රභවය සම්බන්ධයෙන් කිසිදු පැහැදිලි අදහසක් ඉදිරිපත් නොකළ ඔහු දේශපාලන අභිමතාර්ථ ඉෂ්ඨ කර ගැනීමට රාජ්‍යයක තිබිය යුතු පදනම බලය වන බැවින් ඔහු ඒ අසීමිත බලතල පාලකයාට ඇති බව ස්ථිර කළේය. බලය හා එම ජයග්‍රහණය උදෙසා සාපරාධී ක්‍රියාවන්ද සාධාරණීකරණය කළ ඔහු "බලය" වූ කලී නිදහසේ කරන තරඟයකදී තමන් සතු නිපුණතාව මත කුමන ආකාරයකින් හෝ එය උදුරා ගැනීමටත්, බලය පාවිච්චි කිරීමටත් පාලකයාට ඇති අයිතිය තහවුරු කළේය.

ඒ අනුව ජනාධිපති බලතල ලබාගත් ජේ. ආර්. ජනාධිපතිවරයාගේ සිට මහින්ද රාජපක්ෂ දක්වාම මැකියාවෙලී දර්ශනය අනුව බලය ආරක්ෂා කරගනිමින් හොඳින් හෝ නරකින් බලය පාවිච්චි කිරීමට හැකිතරම් උත්සාහ කළෝය.

එදා චන්ද්‍රිකාට බලය ලබා ගැනීමට විශාල මෙහෙයක් ඉටු කළ වික්ටර් අයිවන් පසු කලකදී තමන්ගේ "චෞර රැජිණ" කෘතිය තුළින් චන්ද්‍රිකා ගැන කිව්වේ මෙසේය.

"චන්ද්‍රිකා බලයට ආවේ දූෂණය භීෂණය නැති කොට විධායක ජනාධිපති ධූරයද අහෝසි කොට යුක්තිය හා සාධාරණය රජයන ප්‍රජාතන්ත්‍රවාදී දේශයක් ඇති කිරීමට පහළ වූ විමුක්ති දායිකාවක් ලෙසිනි. එහෙත් ඇය බලයට පැමිණීමෙන් පසු රට පාලනය කළේ චෞර රැජිණක් ලෙසිනි. ඇයට ඇගේ රජ ගෙදර නමගිය අපරාධකරුවන්ගෙන් යුතු විශේෂ මාෆියාවක් තිබුණි. ඇය ඇයගේ එම මාෆියාව ලවා කරදරකාරියන් ලෙස පෙනෙන අය විටෙක හිංසාවටද තවත් විටෙක ඝාතනයටද ලක් කළාය."

බලය ඇති කළ හා නැති කළ වෙනස අරුමය. එය ජනතා විමුක්ති පෙරමුණට තවම දැනෙන්නේ නැත. සරත් කෙනෙකු බලයට පත් වුවහොත් ජනතා විමුක්ති පෙරමුණටද ඔහු ගැන ඉහත ලෙසට ලිවීමට හෝ කඳුළු සලා අඬමින් ඝාතනය වන්නටද සිදුවේ. බලය නැතිකමින් දේශපාලනයට තල්ලු වූ සරත් ෆොන්සේකාලා බලය ලබාගත් විට කරන්නේ කුමක්දැයි අපිට දැනෙන්නේ එලෙසය.

එහෙත් මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා පිළිබඳව කළකිරීමක් ඇති වන්නේ සරත්ගේ සිත තැලීම නිසා නොවේ. අහිංසක ජනතාවගේ සිත තලන නිසාය. ඔහුගේ ජනප්‍රියභාවය අඩුවන්නේද ඒ සිත් තැලීම නිසාවෙනි. ඔහු වටේම සිටින්නේ දූෂකයන්ය. ඔහුගේ සහෝදර පිරිස දූෂණ ලැයිස්තුවල ඉහළින්ම සිටින බව ජනතාවගේ විශ්වාසයයි. ආර්ථිකය ජයගැනීමට ඔහු ළඟ පැහැදිලි සැලැස්මක් නැත. රැකියා වියුක්තිය, ජීවන වියදම, සෞඛ්‍යය, අධ්‍යාපනය විසඳීමට තවමත් පැහැදිලි අමාත්‍යවරුන් පිරිසක් ඔහු අසල නැත. මර්වින් සිල්වා, අනර්කලී ආකර්ෂා වැන්නවුන් ගැන අනුකම්පාවෙන් බලන ඔහු සාමාන්‍ය ජනතාවට කඳුළු ගෑස් ගසයි. අනාගතයේදී වෙඩි උණ්ඩ පාවිච්චි කිරීමට වුවද ඔහු පසුබට නොවන බව එයින් පෙනී යයි. එහෙයින් මාධ්‍යකරුවන් හා ජනතාව බලාපොරොත්තු වන හමුදා ආණ්ඩුව මහින්ද රාජපක්ෂ පරපුර තුලින් වුවද බිහිවීමට බැරි නැත. එනිසා සරත්ට ඡන්දය දුන්නත් මහින්දට ඡන්දය දුන්නත් සිදුවන්නේ එකම නම් නොදන්නා සරත්ට වැඩිය දන්න මහින්ද හොඳය.

එනිසා සරත් ෆොන්සේකා නමැති චරිතය දේශපාලනයට කැන්දාගෙන ඒමට වෛර දරන මංගලට එය කිරීමට තිබුණේත් සරත්ට දේශපාලනයට ඒමට තිබුණේත් චන්ද්‍රිකා සමයේය.

මහින්දව ජනාධිපති කිරීමට කෑ ගැසූ මංගලට එය එදා කළා නම් ඔහුගේ අගමැති සිහිනය හා අනාගත ජනාධිපති සිහිනය ඔහු ලවා ඉටුකරවා ගැනීමට තිබුණි. මන්ද සරත්ගේ සිත වැඩියෙන්ම තැලුවේ චන්ද්‍රිකා නිසාය.

එහෙයින් මේ සියලු කාරණා සැලකිල්ලට ගතහොත් පන්සිය පනස් ජාතක කථා පොතෙන් සරත් ෆොන්සේකාලා වැනි චරිත වුවද එළි පෙහෙළියට ගෙන කථා නිර්මාණය කොට ඇත. එහි එන දළ්හ ධම්ම ජාතකයෙන් පවසන්නේ එවැනි කථාවකි. දළ්හ ධම්ම රජුට සිටි ශක්තිමත් ඔටුවෙකු රජු සමඟ යුධ පිටියට බැස එකාවන්ව සටන් කර රජ යුද්ධයෙන් දිනෙව්වේය. යුධ සමයේ ඇතිවූ තුවාලවලට බෙහෙත් දමා ඔටුවාට විශේෂ සැළකිලි දක්වා ඔහුව සුවපත් කළ රජු ටික කලකදී ඔටුවාව අමතක කර දැම්මේය. රජුගෙන් මිදී ඔටුවා ඉබාගාතේ ඇවිදින්නට විය. කොරගසමින් යන ඔටුවා දුටු කාටත් ඌ ගැන අනුකම්පාවක් උපන්නේය. කුඹල්කරුවෙකුට අසුවූ ඔටුවාගෙන් වැඩගත් කුඹල්කරු ඌව අමතක කර දැම්මේය. රජුට මේ බව සැලවිය. රජු නැවත ඔටුවා ගෙන්වා ඌට සැලකිලි සත්කාර කර මියයන තුරු රැකබලා ගත්තේය. දළ්හ ධම්ම ජාතකයෙන් දෙන පණිවිඩය එය වුවත් මහින්දගේ නැවත ආරාධනය සරත් ප්‍රතික්ෂේප කළේය. එහෙත් ඔහු මැතිවරණයට ඉදිරිපත් වුවහොත් පරාජය වූ සරත් නැවත මහින්ද ළඟට එනවා නොඅනුමානය.

Victoria Mercantile
LAWYERS

- Advice On Legal Matters
- Motor Vehicle Accident Claims
- Debt Recovery & Enforcement

Anne Heenatimulla LLM (Monash)
Barrister & Solicitor
Attorney-at-Law (Sri Lanka)

Phone: (03) 8787 8590
Fax: (03) 9015 6724
Mobile: 0401 684 689
Email: VMLawyers@y7mail.com
Address: 10 Yellowbox Crescent, Lyndhurst VIC 3975

